2026 ක් වූ මාර්තු මස 10 වන දින දීය

දකුනු ඔස්ට්‍රේලියාවේ අන්තිම කැමති පත්‍රයක් ලිවීම පිලිබඳ ව Succession Act 2023 (SA) හී සඳහන් වේ. මෙම පනත 2025 ජනවාරි මස 1 වන දින එලිදක්වන ලදී.

අන්තිම කැමති පත්‍රයක් ලියා තබන අය Testator නමින් ඉංග්‍රීසියෙන් හදුන්වනු ලබයි.

Executor යනුවෙන් හදුන්වන්නේ අන්තිම කැමති පත්‍රයක් ලියා තබන අය මියගිය පසුව එකී අයගේ ප්‍රාර්තනාවන් ඒ ආකාරයෙන් ක්‍රියාත්මක කරන්නා වේ.

Administrator යනුවෙන් හදුන්වන්නේ අන්තිම කැමති පත්‍රයක් ලියා නොතබා මිය ගිය පසු අධිකරනය මගින් ඒ අයගේ බූදලය පාලනය කිරීම සදහා පත් කරන්නා වේ.

ත්‍යාගලැබුම්කරුවන් Beneficiaries ලෙස හදුන්වයි.

ඔබ අන්තිම කැමති පත්‍රයක් ලියා තැබුවා ද? එහි වැදගත්කම දන්නේද?

සෑම කෙනෙකුම ඔස්ට්‍රේලියාවේ ජීවත්වන්නේ නම් අන්තිම කැමති පත්‍රයක් ලියා තැබීම අවශ්‍ය වේ. එය ඔහු හෝ ඇය ජීවත්ව සිටින කාලයේ අත්සන් කරනු ලබන ඉතා වැදගත් ලේඛනයක් ලෙසට හැදින්විය හැක.

අන්තිම කැමති පත්‍රයක් ලියා තබන අය ලේඛනය හොදින් කියවා තේරුම් ගත් බවට හා වයස අවුරුදු 18 ඉක්මවූ දෙදෙනෙකු ඉදිරියේ ලියා අත්සන් කළ යුතුවේ.

අන්තිම කැමති පත්‍රයක් ලියා තැබීමෙන් ඔබගේ බූදලය සම්බන්දයෙන් පැන නැගිය හැකි ප්‍රශ්ණ හා ආරවුල් බොහොමයක් වැලැක්වේ. එකී ආරවුල් විසඳීමට පසුව නඩු මගට බැසීම ඉතා වියදම් අධික ක්‍රියාවක් වන අතර එය ලියා තැබීම ඔබ වඩාත් ආදරය කරනු ලබන අයට එය ඉතා සැනසීමක් වේ.

අන්තිම කැමති පත්‍ර පිලිබඳ හසල පල පුරුද්දක් ඇති අපගේ සොලිසිටර්වරුන් හමුවන්න. ඔවුන් පැහැදිලිව හා නිවැරදිව ඔබගේ අන්තිම කැමති පත්‍රය ලිවීම තුලින් අනාගතයේ ඔබගේ බූදලය සම්බන්දයෙන් ඇතිවිය හැකි උරුමය පිළිබඳ ගැටලු හෝ අභියෝග ජය ගැනීමට හැකිවනු ඇත. එමගින් ඔබ මිය ගිය පසු උරුමය පිළිබඳ නඩු කටයුතු වලක්වා ගත හැක.

අන්තිම කැමති පත්‍රයක් ලිවීම තුලින් වෙනත් කාරනා වලට අමතරව පහත සදහන් කරුනු ස්ථිරව ලියා තැබිය හැක.

- බූදලය කවුරු විසින් පරිපාලනය කළ යුතුද වග
- ඔබගේ දේපලේ උරුමය කාහට හිමිවිය යුතුද
- උරුමක්කරුවන්ට විශේෂ ත්‍යාග ලබා දීම
- බාළ වයස්කාර දරුවන්ගේ භාරකාරත්වය කාට දියයුතුද වග සහ
- දේහය පිළිබඳ අවසාන කටයුතු කෙලෙසක සිදුවිය යුතුද වග.

එසේ නම් වහාම Troubridge Barristers & Solicitors හී අපගේ නීතීඥවරුන් හමුවන්න.